www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජනපද මාධ්‍ය යුක්‍රේනය පිලිබඳ දුෂ්-ප්‍රචාරක ප්‍රහාරයක් උසි ගන්වයි

## US media escalates propaganda offensive on Ukraine

2014 මාර්තු 4

එක්සත් ජනපද හා යුරෝපා බලවතුන් සංවිධානය කල යුක්‍රේනයේ දක්ෂිනාංශික කුමන්ත්‍රනයෙන් ඉක්බිතිව ඇමරිකානු මාධ්‍යය රුසියාවට එරෙහිව යුද ගිනි අවුලුවන ප්‍රචාර රොත්තකින් ප්‍රතිචාර දක්වමින් සිටියි.

පුවත්පත්වල ද රූපවාහිනියේ හා ගුවන් විදුලියේ ද රුසියාව යක්ෂ වෙස් ගැන්වීම නිර්දය අයුරින් සිදු වේ. සිදුවීම් වාර්තා කිරීමේ දී අනුගමනය කරන්නේ තනි අතිසරල කතා කීමකි. රුසියාවේ ක්‍රියා නිරූපනය කෙරෙන්නේ දුෂ්ටත්වයේ මූර්තියක් ලෙස ය. එරට ජනාධිපති ව්ලැඩිමීර් පුටින් බිහි වී ඇති යක්ෂයා ය.

රුසියාව ගන්නා පියවර යටින් පවතින්නා වූ ඓතිහාසික පසුබිම, ආර්ථික අවශ්‍යතා, දේශපාලන සන්දර්භය හා භූ-මූලෝපායික ගනන් බැලීම් නො සලකා හැරේ. මෙතරම් විකාර සහගත නැත් නම් හාස්‍ය ජනක බොරුවක් ඇත්තේ නැත. ප්‍රචාරක ව්‍යාපාරයේ අරමුන මහජන මතය ඒත්තු ගැන්වීම නො ව, එය බිය ගැන්වීම ය.

"රුසියාවේ ආක්‍රමනය" මැයෙන් *නිව් යෝක් ටයිම්ස්හි* සඳුදා පල වූ ප්‍රධාන කතුවැකිය තුල විශ්ලේෂනයක ලකුනක් වත් අඩංගු නැත. එය මුලුමනින් ම සමන්විත වන්නේ හෙලා දැකීම්, යුද කඩු හරඹයේ තර්ජනයෙන් බිය ගැන්වීම් හා සීමා රහිත කුහකත්වයෙනි.

*ටයිම්ස්* පත්‍රය පටන් ගන්නේ "ක්‍රිමියාවේ පාලනය අල්ලා ගැනීම පිනිස පුටින් යුක්‍රේන අර්බුදය නරුම හා සාහසික ලෙස ගසා කයි" යන හෙලා දැකීමෙනි. යථාර්ථය එහි ඔලුවෙන් සිටවේ. රුසියානු දේශ සීමාවේ පිහිටි රටක පාලන තන්ත්‍රය වෙනස් කිරීමට එක්සත් ජනපදය යුක්‍රේනයේ දක්ෂිනාංශික හා ෆැසිස්ට් හමුදාවන්ට සහාය දුන්නේ ය. යුක්‍රේනයේ එක්සත් ජනපද තානාපති හා සහකාර රාජ්‍ය ලේකම් අතර පැවැත්වුනු, පසු ගිය මාසයේ එලිමහනට ආ දුරකථන සාකච්ඡාවක් තුලින් මෙම මෙහෙයුම් ලෝකයට හෙලිදරව් කෙරුනි. එහි දී සාකච්ඡා කර ඇත්තේ, වොෂින්ටනයේ අනුග්‍රහය ලත් නව ආන්ඩුවේ සංයුතිය ගැන ය. සැබවින් ම, *ටයිම්ස්* පත්‍රය මේ පිලිබඳව සඳහන් නො කරයි.

හුස්ම හිර කරවන නරුමත්වයකින් යුතුව *ටයිම්ස්* පත්‍රය, රුසියාව "සීලාචාර චර්යාවේ සීමාවන්ගෙන් බොහෝ ඈතට පියවර තබා ඇති බව හා ජාත්‍යන්තර තත්වය හා ආර්ථික සම්බන්ධතාවන් තුල මීට විශාල මිලක් ගෙවන්ට සිදු වන බව" පුටින්ට කිව යුතු යැයි ඔබාමාගෙන් ඉල්ලා සිටියි.

"සීලාචාර චර්යාවේ" සීමාවන්ගෙන් පිටත සිටින්නේ කවුද? එක්සත් ජනපදය පැනමාව, ග්‍රෙනේඩාව හා වියට්නාමයේ සිට ඇෆ්ඝනිස්ථානය, ඉරාකය, ලිබියාව හා සිරියාව දක්වා එක් රටකට පසු තව රටකට මැදිහත් වී ඇත. පසු ගිය විසිපස් වසර පුරා එහි මිලිටරි මෙහෙයුම්වල ප්‍රතිඵලය වී ඇත්තේ අඩු වශයෙන් පුද්ගලයන් දශලක්ෂයක් මිය යාම යි.

"ක්‍රිමියාවේ පුටින්ගේ අපරාධ" නමින් පල වූ රොජර් කොහෙන්ගේ තීරු ලිපියක් ද *ටයිම්ස්* පත්‍රය පල කර තිබේ. ඔහු බුද්ධිමතෙකු හා විදේශ ප්‍රතිපත්ති විශේෂඥයෙකු ලෙස වෙස් ගත්තෙකි. බෝල්කන්වල සිට සිරියාව දක්වා එක්සත් ජනපදය සිදු කල මිලිටරි ආක්‍රමනයන්හි සෑම පියවරක් ම ඔහු අවුරුදු ගනනාවක් තිස්සේ ආරක්ෂා කර ඇත. එක්සත් ජනපද හිටපු ලිබියානු තානාපති ක්‍රිස්ටෝෆර් ස්ටීවන්ස්ගේ කිට්ටු මිතුරෙකු ලෙස ඔහු සලකනු ලබයි. මුවම්මර් ගඩාෆිගේ ආන්ඩුව පෙරලා දැමීමේ මෙහෙයුම සංවිධානය කිරීමෙන් පසු බෙන්ගාසි නගරයේ පිහිටි එක්සත් ජනපද තානාපති කාර්යාලයේ දී ස්ටීවන්ස් මරුමුවට පත් විය.

කොහෙන්ගේ තීරු ලිපියෙහි අපහාස හා පරිහාස වදන් වැලක් අන්තර්ගත වේ. යුක්රේනයේ බලයෙන් පහ කෙරුනු නායක යනුකොවිච්, "වැඩ බැරි, සල්ලාල, වෙඩික්කාර ජනාධිපතියෙකු" ලෙස ද පුටින් රුසියාවේ "පරමාධිකාරය" සමග "ගැට ගැසුනු" අයෙකු ලෙස ද විස්තර කෙරේ.

පුටින්ගේ ක්‍රියාවන් පින්තාරු කෙරෙන්නේ නො වටහා ගත හැකි ඒවා ලෙස යි. "බෝල්ටික් රටවලට නේටෝව ව්‍යාප්ත වීම, යුරෝපා සංගමය පෝලන්තය හා රුමේනියාව වැලඳ ගැනීම, නේටෝව සර්බියාව මැඩ ලීම" හෝ " ලිබියාව තුල තම අභිමතය ඉටු කර ගැනීමට එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියක් පිලිබඳව බටහිර සිදු කලේ යැයි කියන උපාමාරු" මගින් තර්ජනයක් එල්ල වන්නේ යැයි ඔහුට හැඟෙන්නේ ඇයි? පැහැදිලිව ම, පුටින් පිස්සෙකි!

කෙටියෙන් අවඥා සහගතව ඉතිහාසයට පනින කොහෙන්, දෙවැනි ලෝක යුද්ධය අවධියේ යුක්රේනයෙහි සිදු කල නාසීන්ගේ අපරාධ ගැන එහෙන් මෙහෙන් සඳහන් කරයි. ඔහු එසේ කරන්නේ, ඒවා ස්ටැලින්ගේ අපරාධ අඛන්ඩව ඉදිරියට යෑමක් ලෙස දක්වමිනි. "ස්ටැලින්ගෙන් ඉක්බිති නාසීන් නරක ම දේවල් සිදු කලේ" යැයි ද "තවත් මිලියන ගනනාවක් මිය ගිය" බව ද මොන ම තැකීමක් වත් නැතිව ම ඔහු සඳහන් කරයි. මෙහි දී කොහෙන්, අද ජර්මනිය නැවත මිලිටරීකරනය කිරීම යුක්ති සහගත කිරීමේ

උත්සාහයක කොටසක් ලෙස, නාසි අපරාධ සාපේක්ෂකරනය කරන්නා වූ දක්ෂිනාංශික ඉතිහාසඥයන්ගේ වැඩෙන ලැයිස්තුවකට තෙමේ ද එකතු වෙයි.

පැහැදිලි කිරීමකින් තොරව ම කොහෙන් ඊට පසුව සඳහන් කරන්නේ, "බාබි යා මලකඳන් පිරි ගිරි කඳුර" ගැන ය. කොහෙන් සඳහන් කරන්නේ ස්ටැලින්ගේ ම්ලේච්ඡ ක්‍රියා ගැන යැයි ඉතිහාසය ගැන නොදන්නා පාඨකයන් සිතා ගැනීමට ඉඩ ඇත. යුක්‍රේනියානු අගනුවර වන කීයෙව්හි බාබි යා ගිරි කඳුර යනු, 1941 සැප්තැම්බර් 29-30 දිනවල නාසීන් විසින් යුදෙව්වන් 33,000ක් බිහිසුනු ලෙස මරා දමන ලද භූමිභාගය බව ඔහු සඳහන් කරන්නේ නැත.

මෙය සිදු වුනේ, සෝවියට් සංගමයට එරෙහිව "නාසි සමූල ඝාතන යුද්ධය" ආරම්භ වී යන්තම් තුන් මසකට පසුව ය. ජර්මානු අධිරාජ්‍යවාදයේ මෙහෙයුම්වලට යුරෝපා යුදෙව්වන් මිලියන හයක් ඝාතනය කිරීම ද ඇතුලත් විය. ජර්මානු ෆැසිස්ට් තන්ත්‍රයේ ප්‍රහාරය පරාජය කිරීම වෙනුවෙන් දල වශයෙන් සෝවියට් සොල්දාදුවන් හා සිවිල් වැසියන් මිලියන 27ක් දිවි දුන්හ.

කොහෙන් බාබි යා ගැන සඳහන් කරන්නේ, වර්තමානයේ එක්සත් ජනපදය හා ජර්මනිය එක්ව කටයුතු කරන යුක්‍රේන බලවේගයන්හි දේශපාලන පැටිකිරිය ගැන කතා නො කරමින් වීම අර්ථභාරී ය. විරුද්ධ පාර්ශ්වයේ ආධිපත්‍යය දරන්නේ උග්‍ර යුදෙව් විරෝධීන් ය.

යනුකොවිච් බලයෙන් පහ කල විරෝධතාවන් තුල ප්‍රධාන දේශපාලන බලවේගය වූයේ ස්වොබෝදා පක්ෂය යි. එය පිහිටුවන ලද්දේ එහි පූර්වගාමී සංවිධානය වන යුක්‍රේනයේ සමාජ ජාතික පක්ෂය (එස්එන්පීයූ) සිය නම වෙනස් කිරීමේ කොටසක් ලෙස 2004 දී ය. එහි සාමාජිකයන් වොෆෙන් එස්එස් (නාසි පක්ෂයේ සන්නද්ධ අංශය) විසින් පාවිච්චි කල නිල ලාංඡනය පැලඳි අතර මෙම පක්ෂයට එහි නම වෙනස් කිරීමට බල කෙරුනේ, ෆැසිස්ට්වාදය සමග එයට පැවති කිට්ටු සම්බන්ධකම නිසා ය. "තැඹිලි පැහැ විප්ලවය" (ඔරෙන්ජ් රෙවලූෂන්) තුලට එය ඒකාබද්ධ කිරීමට එක්සත් ජනපදය දැරූ උත්සාහය ඉන් අවුල් කෙරෙන හෙයිනි. "තැඹිලි පැහැ විප්ලවය" අවසාන වශයෙන් ක්‍රියාත්මක කෙරුනේ 2005 දී ය.

ඔලේ ටියානයිබොක් ස්වොබෝදා පක්ෂයේ දීර්ඝ කාලීන නායකයා වන අතර පසු ගිය මාසයේ පාලන තන්ත්‍ර වෙනස සංවිධානය කල රැස්වීමට එක්සත් ජනපද හා යුරෝපා සංගම් නිලධාරීන් සමග ඔහු ද සහභාගි විය. 2004 දී මවුන්ට් යවෝරිනාහි දී කතාවක් පවත්වමින් ටියානයිබොක් දෙවන ලෝක යුද්ධ කාලයේ යුක්‍රේන කැරලිකාර හමුදාවට (යූඅයිඒ) ප්‍රශංසා කලේ ය. යූඅයිඒ "රුසියානුවන්ට එරෙහිව සටන් කලේ ය, ජර්මානුවන්ට එරෙහිව සටන් කලේ ය, යුදෙව්වන්ට හා අපගෙන් යුක්‍රේන රාජ්‍යය උදුරා ගැනීමට අවශ්‍ය වූ අනෙකුත් කුනු ගොඩවලට එරෙහිව සටන් කලේ ය" යි ඔහු පැවසී ය. ටියානයිබොක් සිය ශ්‍රාවකයන්ට ප්‍රශංසා කලේ ඔවුන් " යුක්‍රේනය පාලනය කරන රුසියානු-යුදෙව් මාෆියාවට" මහත් සේ බිය එලවන බලවේගය ලෙස හඳුන්වමිනි. 2005 දී, ටියානයිබොක් යුක්‍රේනයේ යුදෙව් සංවිධාන තහනම් කිරීම ඉල්ලා සිටි පෙත්සමකට ද අත්සන් කලේ ය.

රොජර් කොහෙන් යුක්‍රේනය තුල එක්සත් ජනපදයේ අනුචරයන් වන ෆැසිස්ට්වාදී හා යුදෙව් විරෝධී හමුදාවන් ගැන කිසි ම සඳහනක් කිරීම සිතාමතා මග හරියි. කෙසේ වෙතත්, මෙහි දී කොහෙන් හුදෙකලා වී නැත. මෙම විෂය එක්සත් ජනපද මාධ්‍යය තුල මුලුමනින් ම තහනම් ය.

*නිව් යෝක් ටයිම්ස්හි* පිලිවෙත *වෝල් ස්ට්‍රීට් ජර්නලයේ* කතුවැකියක ද අනුගමනය කර ඇත්තේ "අලජ්ජී ආක්‍රමනය සීතල යුද්ධයේ අවසානයෙන් පසු පලමු වරට යුරෝපයේ හදවතට යුද්ධයේ අනතුර ගෙන එයි" යනුවෙන් සඳහන් කරමිනි. *වොෂින්ටන් පෝස්ට්හි* මෙය අවධාරනය කරන්නේ ඔබාමා පාලනය "රුසියාව යුක්‍රේනය ආක්‍රමනය කිරීමේ ඵල විපාක පැහදිලි කල යුතු" බව කියමිනි. එමෙන් ම ඇමරිකාව තුල ෆැසිස්ට්වාදී හා යුදෙව් විරෝධී ප්‍රවනතාවක හිටපු ලැරෝකයිට්වාදියෙකු වන නේෂන් පත්‍රයේ ප්‍රධාන විදේශ ප්‍රතිපත්ති වාර්තාකාර රෝබට් ඩ්‍රේෆියුස් "ව්ලැඩිමීර් පුටින් ඉවත් විය යුතු යි" යනුවෙන් ලියා ඇත.

එක්සත් ජනපද මාධ්‍ය ප්‍රතිචාරයේ සම්බන්ධීකරනය වූ ස්වභාවයෙන් පැහැදිලි වන්නේ යමෙකු පොර බදන්නේ තනි තනි පුද්ගලයන්ගේ රචනා සමග නොවන බව යි. ඊට විපරීතව දිග හැරෙනේනේ, මීට පෙර සිතා ගැනීමට වත් නොහැකි යැයි සලකන ලද ක්‍රියාවන් පිලිගැනීම සඳහා ජනතාවගේ සිත් හැඩ ගැස්වීමට, ඉතා ඕනෑකමින් පිලියෙල කල සැලැස්මකි.

බලවත් ප්‍රතිපත්ති විශේෂඥයෝ මිලිටරි පියවර සඳහා හඬ තලති. මූලෝපායාත්මක හා ජාත්‍යන්තර අධ්‍යයනය සඳහා කේන්ද්‍රයේ ඇන්ඩෘ කුෂින්, ක්‍රිමියාවට ඔබ්බෙහි රුසියානු මිලිටරි මැදිහත් වීම, "රතු ඉරකි. කිසි යම් ආකාරයකින් රතු ඉර පැන්නොත් එහි තේරුම වන්නේ යුක්‍රේන හා නේටෝ හමුදා සමග යුද්ධයක් ඇති වීම යි" සඳහන් කරයි. ඔහු තව දුරටත් මෙසේ ද පවසා ඇත: "යුක්‍රේන වෙරලට සමීපව කලු මුහුදේ එක්සත් ජනපද හා නේටෝ හමුදා යෙදවීම අවශ්‍ය ය."

එවැනි යුද්ධයක් විනාශකාරී ප්‍රතිවිපාක දනවනු ඇත. යුද්ධයට එරෙහිව සටන් කිරීම සඳහා මාධ්‍ය මුසාවාද හෙලි කිරීමේ නිර්දය අරගලයක් අවශ්‍ය වේ. අප අපගේ පාඨකයන්ගෙන් ඉල්ලන්නේ කම්කරුවන් හා තරුනයන් අතර *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* අනුගාමිකත්වය වැඩි කරන ලෙස ය. අපගේ ලිපි බෙදාහදා ගන්න. ඒවා බෙදා හරින්න. පවත්නා බරපතල අනතුර පිලිබඳව ලෝක ජනතාව සුපරීක්ෂාකාරී කල යුතු ය.

**ජෝසෆ් කිෂෝර් හා ඩේවිඩ් නෝර්ත්**

© www.wsws.org